# වාර්ෂික වාර්තාව

# 2017

*අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය*

# වාර්ෂික වාර්තාව 2017

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

428/11ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන: +94112879539 ෆැක්ස්: +94112879540
ඊ - මේල්: witness.protection.srilanka@gmail.com

# පටුන


- අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය 04
- දැක්ම සහ මෙහෙවර 05
- විධායක සාරාංශය 6-7
- හැඳින්වීම 8-9
- අරමුණු 10
- වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් 11-12
- අධිකාරියේ කාර්ය හා කර්තව්‍යන් 13-14
- අධිකාරියේ බලතල හා කාර්යභාර 15
- පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය 16
- කළමනාකරණ මණ්ඩලය - 2017 17
- කාර්ය මණ්ඩලය - 2017 18-21
  - ✓ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය
  - ✓ සහාය කාර්ය මණ්ඩලය
    - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)
    - රියදුරු
    - කාර්යාල කාර්ය සහායක
    - කාර්ය මණ්ඩල සාරාංශය
- කාර්ය සාධන වාර්තාව 22-27
- ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ 28
- මූල්‍ය ප්‍රගතිය (අවසාන ගිණුම්) 29-46
- විගණන වාර්තාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පළමු වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවුඩය මා ගෙන එන්නේ ඉමහත් සතුටිනි. 2017 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සිහි ගැන්වීම සඳහා මෙය විශේෂ අවස්ථාවක් කර ගනිමි.

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ 2016 මැයි මස 18 වන දින සිට බත්තරමුල්ලේ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, පළමු මහලේ අංක 428/11ඒ දරන ස්ථානයේ පිහිටුවා ඇත. අපරාධවල වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වාදීමෙන් 2017 වර්ෂය ඇතුළත අප ආයතනය සැලකිය යුතු ප්‍රගතියක් අත්පත්කර කරගත් බව කිව යුතුය. මේ වන විට අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරු හතරක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකක් සහ කළමනාකරණ මණ්ඩල ලේකම් තනතුර සඳහා මෙන්ම සහාය කාර්ය මණ්ඩලය සඳහා ද නිලධාරීන් බඳවා ගැනීම සිදු කර අවසන්ය.

2016 සහ 2017 වසරවල අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙළින් 14ක් හා 49ක් වන අතර ඒ සඳහා විධිමත් විමර්ශන සිදු කොට අදාළ පාර්ශවයන්ට ආරක්ෂාව සහ සහාය ලබා දීමට අධිකාරියට හැකි වී තිබීම ජාතික වැදගත්කමකින් යුතු ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය. මේ වන විට ආයතනයේ ව්‍යුහය සකස් කර ගැනීමට හැකි වීම ද ආයතනයේ සාර්ථකත්වයට හේතු වී තිබේ.

2017 වසර තුළ අපරාධවල වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් සහ යටිතල පහසුකම් සංවර්ධනය කරනු වස් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල හා ගිවිසුම්ගත වීම අධිකාරිය ලද සුවිශේෂ ජයග්‍රහණයකි. එලෙස ම 2017 වසර තුළ දී, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යාලය හා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසම වැනි විවිධ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම මඟින් අධිකාරියට සිය අභිමතාර්ථ ඉටු කර ගැනීමට හැකි වීමද අගය කොට සලකමි.

අපරාධවලට ලක් වූවන් සහ සාක්ෂිකරුවන් හට නොබියව සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින්, නීතියේ ආධිපත්‍යය තහවුරු වන පරිදි සිය සමාජ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ සහාය ලබා දීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධනීය ගුණාංග ප්‍රවර්ධනය අධිකාරියේ අනාගත අපේක්ෂාව වන අතර ඒ සඳහා උපරිම දායකත්වය දැක්වීමට අප කැප වන බවද මෙහි ලා විශේෂයෙන් සඳහන් කරමු.

උදයකුමාර අමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

- ✓ <u>දැක්ම</u>

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්**

- ✓ <u>මෙහෙවර</u>

**අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම**

## විධායක සාරාංශය

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලගන්වමින් 2016යේ සිට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි ස්ථාපිත ඇත. අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය, නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනකුගෙන්ද ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින් එවකට සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු පනතෙහි (2) වගන්තියේද, අපරාධයක වින්දිතයකු සතු අයිතිවාසිකම් පනතෙහි (3)වගන්තියේද, අපරාධයක වින්දිතයකු සතු හිමිකම් පනතෙහි (4) වගන්තියේද, සාක්ෂිකරුවෙකු සතු හිමිකම් පනතෙහි (5) වගන්තියේද, තොරතුරු සපයන්නන් සතු හිමිකම් පනතෙහි **(6)** වගන්තියේද, අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය පනතෙහි (13) වගන්තියේද සඳහන් කර ඇති අතර ඒවා පැහැදිලිව මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.

අධිකාරියට අනුමත 54ක කාර්යා මණ්ඩලයෙන්, 2017 දෙසැම්බර් වන විට නිලධාරීන් 26 දෙනකු බඳවා ගනු ලැබූ අතර ඔවුන් පිළිවෙළින් අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන), අධ්‍යක්ෂ (නීති සහ නීති බලාත්මක කිරීම), අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්), අධ්‍යක්ෂ (පාලන හා කළමනාකරණ ) මෙන්ම සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය), සහකාර අධ්‍යක්ෂ (නීති), කළමනාකරණ මණ්ඩල ලේකම් සහ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 10 දෙනකු, රියදුරු 3 දෙනකු සහ කාර්යාල කාර්ය සහායකවරුන් 6 දෙනකු වශයෙනි.

2017 වසරේ අධිකාරිය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි ගණන 49ක් වන අතර 2016 වසරේ ලද පැමිණිලි අතරින් පැමිණිලි 08 ක් 2017 වන විටත් අවසන්ව නොපැවති අතර ඒ අනුව පැමිණිලි 57ක් 2017 වසර තුළ විමර්ශනයට භාජනය කරන ලද අතර ඉන් පැමිණිලි 36 ක විමර්ශන කටයුතු 2017 දෙසැම්බර් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. එම පැමිණිලි වල ප්‍රගතියේ සංක්ෂිප්ත විස්තරයක් මෙම වාර්තාවේ කාර්ය සාධනය යටතේ ඇතුලත් කර ඇත. 2017 වසරේ අවසන් නොකරන ලද මුළු පැමිණිලි ගණන 21 කි. ඉන් පැමිණිලි 4ක් බහා තබා ඇති අතර පැමිණිලි 3ක් නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. ආරක්ෂාව සපයමින් පවතින පැමිණිලි ගණන 2ක් වන අතර නීතිඥ සහාය ලබා දීම සඳහා යොමු කරන ලද පැමිණිලි ගණන 03කි. එක් පැමිණිල්ලක් අවශ්‍ය කටයුතු සඳහා අදාළ ආයතනය වෙත යොමු කර ඇති අතර පැමිණිලි 2ක් සම්බන්ධයෙන් විමර්ශන සඳහා පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කර ඇති අතර විමර්ශන මට්ටමේ පවතින පැමිණිලි ගණන 6කි.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කාර්යාලය විසින් 2017.11.22 දින සිට 2017.11.24 දින දක්වා මාලදිවයිනේ මාලේ නුවරදී පවත්වන ලද දූෂණයට එරෙහිව හඬ නගන්නන් (Whistle Blower) සහ සාක්ෂිකරුවන් (Witness) ආරක්ෂා කිරීම පිළිබඳ දකුණු ආසියානු වැඩමුළුව සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) සහ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) යන නිලධාරීන් සහභාගි වූ අතර එහිදී ශ්‍රී ලංකාවට අදාළ නෛතික තත්වය හා ශ්‍රී ලාංකේය අත්දැකීම් අළලා ඔවුන් දෙදෙනා විසින් කෙටි දේශන

පවත්වන ලදී. තවද, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමේ වැඩසටහන් මාලාව යටතේ කොෆි ජාත්‍යන්තර ලන්ඩන් (Coffey International) ආයතනය විසින් සංවිධානය කරන ලද දූෂණයට එරෙහිව තොරතුරු සපයන්නන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේදී ඇති වන අභියෝග සම්බන්ධයෙන් වන පුහුණු වැඩමුළුවක් 2017 නොවැම්බර් මස 16 වන දින කොළඹ දී පවත්වන ලද අතර එම සැසිවාරය සඳහා  අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) සහ කළමනාකරණ මණ්ඩල ලේකම් සහභාගී විය.

පනත සංශෝධනය කරනු පිණිස ඉදිරිපත් කරන ලද 2017 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ සංශෝධන පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එය 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යන නමින් 2017 නොවැම්බර් මස 17 වන දින සම්මත කර ගන්නා ලදී. එම සංශෝධනයට අනුව මුල් පනතේ 31 වන වගන්තියේ (i) වන උප වගන්තිය සංශෝධනයට ලක් වූ අතර එතෙක් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට සාක්ෂි දෙන තැනැත්තකුට ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ස්ථානයක සිට සාක්ෂි ලබාදීමට ලබා දී තිබූ අවස්ථාව “ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත” දුරස්ථ ස්ථානයක සිට සාක්ෂි දිය හැකිවන පරිදි  “ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත” යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරන ලදී.

අධිකාරියේ කාර්යභාරය කරගෙන යාමේදී මුහුණ දුන් බාධක අතර අවශ්‍ය ප්‍රමාණයට ගොඩනැගිලි පහසුකම් සහ කාර්යාල උපකරණ මෙන්ම සන්නිවේදන අවශ්‍යතා සහ ප්‍රවාහන පහසුකම් වැනි යටිතල පහසුකම් නොතිබීම, සුදුසුකම් හා පළපුරුද්ද සහිත නිලධාරීන්, පවත්නා වැටුප්තල මත සොයා ගැනීමට තිබූ අපහසුකම, අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ක්‍රියාකාරකම් කිරීමට නොහැකි වීම, සැලකිය යුතු කරුණු වේ.

## හැඳින්වීම

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 428/11ඒ දරන ස්ථානයෙහි පළමු මහලෙහි වර්ග අඩි 2800ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත ගොඩනැගිල්ල මෙම ආයතනයේ කාර්යාලය පිහිටුවා ඇත. එම කාර්යාලය අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.01.08 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. පසුව අංක 1966/02 හා 2016.05.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් උක්ත අධිකාරිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව යටතේ 2016.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු අධිකරණ අමාත්‍යවරයා යටතට පවරා ඇත. ඒ අනුව අධිකරණ අමාත්‍යවරයා විසින් අංක 1967/08 හා 2016.05.16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීම පනතෙහි සියලු කොටස් 2016.05.18 දින සිට ක්‍රියාත්මක කොට ඇත.






පනතෙහි 12(ආ) වගන්තිය ප්‍රකාර ව අතිගරු ජනාධිපතිතුමා විසින් 2016.08.11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය පත්කර ඇති අතර එය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශයේ ලේකම්, කාන්තා කටයුතු විෂය හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සමාජිකයකු, නීතිපතිවරයාගේ නියෝජිතයකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධුරය දරන පොලිස්පතිවරයාගේ නියෝජිතයකු ඇතුළත් වන නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත් (7) දෙනකුගෙන්ද අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධ වෘත්තීන්හි අධ්‍යාපනික හෝ වෘත්තිය සුදුසුකම් ලත් සහ

පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ. අතිගරු ජනාධිපතිතුමා විසින්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වන සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුහද කේ. ගමලත් මහතා 2016 අගෝස්තු මස 11 වන දින සිට අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ පනතෙහි අරමුණු**

<u>(පනතෙහි (2) වගන්තිය)</u>

1. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම,ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම.
2. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබා දීම.
3. අපරාධයක වින්දිතයන්ට එරෙහි ව වරදක් සිදු කිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන්හට වන්දි මුදල් ලබා ගැනීමට සැලැස්වීම.
4. ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානි පූරණය සහ පුනරුත්ථාපනය ඇතුළු ව , අපරාධයක වින්දිතයන්හට සහන ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.
5. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ රජයේ අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්යය සහ වගකීම දැක්වීම.
6. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි ව සිදු කළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදු කරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම.
7. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළ ව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

**අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්**

අපරාධයක වින්දිතයකු සතු අයිතිවාසිකම්(පනතෙහි (3)වගන්තිය)

1. සමාන ව සාධාරණ ව වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට සලකවාගනු ලැබීමට (3 (1) (අ) වගන්තිය)
2. ළමා වින්දිතයෙකුවන විටෙක ඔහුගේඋපරිම යහපත තහවුරු වන ලෙස සලකවාගනු ලැබීමට (3 (1) (ආ) වගන්තිය)
3. වින්දිතයකු වීම නිසා යම් අලාභයක් සිදු වුණි නම්, ඒ සඳහා අප්‍රමාද ව සුදුසු සහනයක් ලබා ගැනීමට(3 (1) (ඇ) වගන්තිය)
4. මානසික හෝ කායික හිංසාවක් සිදු වුණි නම් ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට (3 (1) (ඉ) වගන්තිය)
5. තර්ජන හා බියගැන්වීම්වලින් නිසි ආකාරයෙන් ආරක්ෂා වීමට (3 (1) (ඈ) වගන්තිය)
6. වින්දිතයා ඉල්ලීමක් කර ඇති විටදී, අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් නීතිමය තත්ත්තවයන් පිළිබඳව දැනුවත් වීමට, පැමිණිල්ලේ විමර්ශනය පිළිබඳ දැනුවත් වීමට, අධිකරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව දැනුවත් වීමට අවශ්‍ය වෛද්‍ය, සමාජ සේවා සහ අනෙකුත් සේවාවන් පිළිබඳව දැනුවත් වීමට(3 (1) (ඊ) වගන්තිය)
7. පොලිස් නිලධාරියෙකු ලවා පැමිණිල්ලක් වාර්තාගත කර ගැනීමට සහ එම පැමිණිල්ල පූර්ණ ලෙස විමර්ශනය කරවා ගැනීමට(3 (1) (උ) වගන්තිය)
8. වරදකට අදාළ ව විවිධ විමර්ශනයන් සිදු කෙරෙන කාලසීමාවේදී අදාළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු වෙතට නීතිඥයෙකු මගින් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට (3 (1) (ඌ) වගන්තිය)
9. පොලීසිය මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු කළ යුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට(3 (1) (එ) වගන්තිය)
10. වින්දිතයාට එරෙහි ව කර ඇති වරදකට අදාළ ව නඩු කටයුත්තක් පවත්වා ගෙන යාමට පෙර සහ එය පවත්වා ගෙන යන කාලසීමාව තුළ නීතිපතිවරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම පිණිස නීතිඥයෙකු මාර්ගයෙන් ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට (3 (1) (ඒ) වගන්තිය)
11. අදාළ වරද සම්බන්ධයෙන් විමර්ශන පවත්වන විමර්ශකයෙකු වෙත ලිපි යැවීමට හෝ නියෝජනයන් සිදු කිරීමට සහ එම නියෝජනයන්ට ප්‍රතිචාරයන් ලබා ගැනීමට (3 (1) (ඔ) වගන්තිය)
12. වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසු එය දඬුවම තීරණය කිරීමට පෙර, එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳව පුද්ගලිකව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට දැන්වීමට (3 (1) (ඕ) වගන්තිය)
13. වරදකරු අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර තිබෙන විට එම වරද වින්දිතයාගේ ජීවිතයට බලපෑ ආකාරය පිළිබඳ ව පුද්ගලික ව හෝ නීතිඥයෙකු මාර්ගයෙන් අධිකරණයට කරුණු දැන්වීමට (3 (1) (ජ) වගන්තිය)
14. වරද සිදු කරනු ලැබූ තැනැත්තාට සමාවක් දීම සලකා බැලීමක දී හෝ දඬුවමක් ලිහිල් කිරීම සලකා බැලීමක දී ඒ පිළිබඳව දැන්වීමක් ලැබීමට සහ එම වරද වින්දිතයාගේ ජීවිතයට බල පෑ ආකාරය පිළිබඳ ව පුද්ගලිකව හෝ නිතිඥයෙකු මාර්ගයෙන් හෝ අදාළ අධිකාරියට දැන්වීමට (3 (1) (ට) වගන්තිය)

අපරාධයක වින්දිතයකු සතු හිමිකම්(පනතෙහි (4) වගන්තිය)

1. යම්කිසි අධිකරණ කටයුත්තකට සහභාගී වීම නිසා, අපරාධයක වින්දිතයකුට දරන්නට සිදු වූ වියදම් වෙනුවෙන් අධිකාරියෙන් කිසියම් මුදලක් ලබා ගැනීමට(4 (1) වගන්තිය)
2. අපරාධයක වින්දිතයකු වීම නිසා අත්විඳි කායික හෝ මානසික හිංසාවන් සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර, උපදේශන සේවා රජයෙන් ඉල්ලා සිටීම (4 (2) වගන්තිය)
3. රජයට වෛද්‍ය ප්‍රතාකාර හෝ උපදේශන සේවා ලබා නොදිය හැකි අවස්ථාවක දී එකී අවශ්‍යතා පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම සඳහා අධිකාරියට ඉල්ලීමක් කිරීමට (4 (3) වගන්තිය)

සාක්ෂිකරුවෙකු සතු හිමිකම් (පනතෙහි (5) වගන්තිය)

1. සාක්ෂිකරුවන්ගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට සාධාරණයක් වන සේ සහ ගෞරවයෙන් සලකවා ගනු ලැබීමට(5 (1) වගන්තිය)
2. මූලික අයිතිවාසිකමක් කඩ කිරීමටකට අදාළ ව තොරතුරු සැපයීම, යම් වරදක් පිළිබඳ ව විමර්ශනයක් පවත්වන අතරතුරදී ස්වේච්ඡාවෙන් ප්‍රකාශනයක් කිරීම හෝ යම්කිසි වරදක් සිදු කිරීමකට හෝ මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීමේ දී සාක්ෂිකරු කිසිදු හිරිහැරයකට ලක් නොවී සිටීමේ හිමිකම. එවැන්නකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට සාක්ෂිකරුවෙකුට හිමිකමක් ඇත.(5 (1) වගන්තිය)

තොරතුරු සපයන්නන් සතු හිමිකම්(පනතෙහි (6) වගන්තිය)

සාක්ෂිකරුවකු වන හෝ නොවන හෝ යම්කිසි පුද්ගලයෙකු තමාගේ සේවා ස්ථානයේ වන වරදක් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීමකට අදාළ ව තොරතුරු සැපයීම, ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ ඊට අදාළ ව අධිකරණයක දී සාක්ෂි ලබා දීම හේතු කොට ගෙන එකී පුද්ගලයාට කිසිදු හිරිහැරයක් හෝ රැකියාවේ අහිතකර වෙනසකට එරෙහි ව ආරක්ෂාව ලබා ගැනීමට හිමිකමක් ඇත.(6 වන වගන්තිය)

අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය (පනතෙහි (13) වගන්තිය)

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම සහ ඒවාට ගෞරව කිරීම ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම.
4. අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩ කරන ලදැයි යන්න පිළිබඳ ව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩ කිරීම පිළිබඳ ව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම.
5. අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළු ව අවශ්‍ය සහාය සැපයීම.
6. අපරාධයක වින්දිතයන්හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
7. මේ පනත මඟින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීම.
8. විශේෂයෙන් ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට -
   i. ඵලදායී ආරක්ෂාව
   ii. අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ උපදේශනය
   සහ
   iii. වෙනත් සුදුසු සහායයන් සැපයීම ඇතුළු ව,

   අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයක් ලබා දීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන් ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට සහ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට, උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

9. විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහසාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා ඒවා සමලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින් සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම පිළිබඳ ව නිර්දේශ කිරීම.

10. යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත, සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳ ව තොරතුරු ලබා දීමට සැලැස්වීම.

11. අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතු නිසා සිදු විය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස හා සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම.

12. ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළු ව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තිකයන් විසින්, අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලනසංග්‍රහයන් සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම.

**පනතේ 11 වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෙම ජාතික අධිකාරියේ බලතල හා කාර්යභාරය පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.**

- **බලාත්මක කිරීමේ කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ගෞරව කිරීම,ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම.

- **අර්ධ අධිකරණමය කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා විභාග කිරීම, එම උල්ලංඝනයට අදාළ ව උචිත රාජ්‍ය නිලධාරීන්ට සහ රාජ්‍ය ආයතනවලට නියෝග නිකුත් කිරීම

- **සේවා කාර්යභාරය**

  අපරාධයක වින්දිතයන්ටහා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සහ සහය සැලසීම, වන්දි ප්‍රදානය කිරීම

- **නියාමන කාර්භාරය**

  නියමු උපදේශන නිකුත් කිරීම හා අධීක්ෂණය,අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම හා විධි පිළිබඳ ව පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය කිරීම, අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම

## පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

2015 අංක 4 දරනපනත මගින් පිහිටුවන ලද තවත් එක් සුවිශේෂ ඒකකයක් වශයෙන් ජාතික අධිකාරියේ උපදේශනය හා මඟ පෙන්වීම මත ශ්‍රී ලංකා පොලිසිය යටතේ පිහිටුවන ලද ''අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය'' ලෙස හැඳින්වෙන විශේෂ පොලිස් ඒකකයයි. පනතේ 19 (2) වගන්තිය යටතේ කළමනාකරණ මණ්ඩලයට නිල බලයෙන් පත් කෙරෙන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු මෙම කොට්ඨාසය භාර ප්‍රධානියා ලෙස පත් කරනු ලැබ ඇති අතර 2016 නොවැම්බර් මස 03 වන දින සිට මෙහි කටයුතු ආරම්භ කර ඇත.

ජාතික අධිකාරිය මගින් නිකුත් කරනු ලබන නියමු උපදේශන අනුගමනය කරමින් "කොට්ඨාසය" පවත්වා ගෙන යා යුතු අතර අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම, ඔවුන්ට හා ඔවුන්ගේ දේපළවලට සිදු කරනු ලබන තර්ජන, හානි පැමිණවීම් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳ ව "කොට්ඨාසය" විසින් ම පොලිස් නිලධරයෙකුගේ සහාය ඇති ව විමර්ශනය කිරීම කොට්ඨාසයේ කාර්ය විය යුතු අතර ඔවුන්ට ආරක්ෂාව සහ සහාය වීම සඳහා අධිකාරිය මගින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සැලසීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

## අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය

පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයෝ :-

1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව
2. උදයකුමාර අමරසිංහ මහතා
   අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී
4. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී

නිල බලයෙන් පත්වූ සාමාජිකයෝ: -

1. ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව
2. නන්දන මුණසිංහ මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   පොලිස් මූලස්ථානය
3. නීතිඥ එච්.ජී.හුසේන් මහතා
   කොමසාරිස්
   මානව හිමිකම් කොමිෂන් සභාව
4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය
   අතිරේක ලේකම්(නීති)
   අධිකරණ අමාත්‍යාංශය
5. අශෝකා අලවත්තමහත්මිය
   අතිරේක ලේකම් (සංවර්ධන)
   කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
6. විජිතා සෙනෙවිරත්න මහත්මිය
   අතිරේක ලේකම්
   නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය
7. නීතිඥ සජීව සමරනායක මහතා
   නියෝජ්‍ය සභාපති
   ජාතික ළමාරක්ෂක අධිකාරිය

කාර්ය මණ්ඩලය - 2017

- **<u>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය</u>**

1.අධ්‍යක්ෂ ජනරාල් : - උදයකුමාර අමරසිංහ මහතා*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2.අධ්‍යක්ෂ : - එස්.එස්.කේ.කස්තුරිආරච්චි මෙනෙවිය
(නීති හා නීති බලාත්මක කිරීම්)

3.අධ්‍යක්ෂ : -අයි.සිරිවර්ධන මහතා
( ප්‍රතිපත්ති හා වැඩසටහන්)

4.අධ්‍යක්ෂ : - ඩබ්.ජී.එන්.ප්‍රනාන්දු මහතා
(පාලන හා කළමනාකරණ )

5. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) : -ආර්.ඒ.ඩී. චමිලා දිශානි මහත්මිය

6. සහකාර අධ්‍යක්ෂ (නීති) : -පී.එන්.යු. පට්ටිආරච්චි මහත්මිය

7. කළමනාකරණ මණ්ඩල ලේකම් : -බී.ජී.එම්.එස්.ආර්.ඩබ්.ගුණවර්ධන මහත්මිය

ස්ථිර තනතුරුවලට බඳවා ගැනීමට ප්‍රථම වැඩ බැලීමේ පදනම මත පහත නම් සඳහන් නිලධාරීන් පත් කරන ලදි.

1. අධ්‍යක්ෂ : - ඩබ්.ආර්.පරණගම මහතා
(මුදල්) ගණකාධිකාරී-අධිකරණ අමාත්‍යාංශය

2. සහකාර අධ්‍යක්ෂ : -ආර්.එම්.එන්.කේ.කේ.අබේරත්න මහත්මිය
(මුදල් ) ගණකාධිකාරී-අධිකරණ අමාත්‍යාංශය

3. සහකාරඅධ්‍යක්ෂ : - එස්.ඒ.එන්.එම්.සිරිවර්ධන මහත්මිය
(පාලන) සහකාර ලේකම්(පාලන) -අධිකරණ අමාත්‍යාංශය

- **<u>සහාය කාර්ය මණ්ඩලය</u>**

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීහු**

1.සහන් හර්ෂණ අතුකෝරල මහතා

2. එස්.එන්.එච්. නදීෂා මධුමාලි නානායක්කාර මහත්මිය

3.රුවිනි කාංචනා විමලරත්න මෙනෙවිය

4. පී.ඒ. දිලිනි දර්ශිකා පෙරේරා මෙනෙවිය

5. එම්.පී. සචිත්‍රා දූලාෂණී ගුණසේකර මහත්මිය

---

*මෙම ධූරය සඳහා අනුමත මූලික සුදුසුකම් ලද කිසිවෙකු නොසිටි බැවින් කළමනාකරණ මණ්ඩලයේ ආරාධනාවෙන් උදයකුමාර අමරසිංහ මහතා විසින් 2017 අගෝස්තු මස සිට මෙම ධූරයෙහි කටයුතු භාර ගන්නා ලදී.

6. අයි.ඒ. හර්ෂණී ඉලේපෙරුම මෙනෙවිය

7.දර්ශන් රජීව් ජයමණි මහතා

8.උමේෂා හෂිනි ලොකුසූරිය මෙනෙවිය

9. ඒ.වී.ඩී.එන්.සී.ජයනි සෙනෙවිරත්න මෙනෙවිය

10. එම්. ජෙත්මි නදුනිකා පීරිස් මෙනෙවිය

- **<u>රියදුරු</u>**

1. යූ.ඩබ්. විමංග පැතුම් මහතා
2. ඩී.එම්. සම්පත් නිශාන්ත බණ්ඩාර මහතා
3. ඒ. ප්‍රභාත් නිශාන්ත මහතා

- **<u>කාර්යාල කාර්ය සහායකවරු</u>**

1. ටී.ඩබ්. නදීශානී ප්‍රනාන්දු මෙනෙවිය

2. ජේ.ජී. චාමලී මල්කාන්ති විජේවික්‍රම මහත්මිය

3. ඩබ්.එම්. විමල බුද්ධික මහතා

4. ඒ.ඒ. ප්‍රදීප් කුමාර පෙරේරා මහතා

5. ඩබ්.එච්.ආර්. මධුකා ප්‍රබෝධනී මහත්මිය

6.කසුන් මධුසංක යකුපිටිය මහතා

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය**


**කාර්ය මණ්ඩල සාරාංශය -2017/12/31**

**වගුව 01**

| වර්ගය | වැටුප් කේතය | ක.සේ.දෙ. අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM 2-3 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 5 | 3 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 2 | 1 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 2 | 0 | 2 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 0 | 6 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 0 | 1 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 10 | 10 | 0 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 3 | 3 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 6 | 0 |
| **එකතුව** | | **54** | **26** | **28** |

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත සේවක සංඛ්‍යාව**

සටහන 01




## කාර්ය සාධන වාර්තාව

- අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම 2017.07.03 දින සිට ක්‍රියාත්මක වූ අතර ඊට පෙර අධිකාරියට ලැබෙන පැමිණිලි සම්බන්ධ විමර්ශන කටයුතු සියල්ල සිදු කරන ලද්දේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මඟිනි.
- 2017 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2017.12.31 දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නීති හා නීති බලාත්මක කිරීමේ අංශය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද ඉල්ලීම් සහ පැමිණිලි සහිත ලිපි ගණන භෞතික වශයෙන් ගත්කළ 49ක් වේ.එසේ වුව ද එක් ලිපියක ඉල්ලීම් කිහිපයක් පැවති අවස්ථාද දක්නට ලද බැවින් අදාළ ලිපි ඒවායේ සඳහන් ඉල්ලීම් අනුව පහත පරිදි වර්ගීකරණය කරන ලදි.

වගුව 02

| ඉල්ලීමේ ස්වභාවය | ඉල්ලීම් ගණන |
|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | 07 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 08 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 07 |
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 05 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 01 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 05 |
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි, 8,9 වගන්තිය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 02 |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි ,ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් සහ සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| වෙනත් ඉල්ලීම් | 10 |
| **එකතුව** | **49** |

ප්‍රස්ථාරය 02





- 2016 වසරේ ලද පැමිණිලි අතුරින් පැමිණිලි 08ක් 2017.01.01 දින වන විටත් අවසන්ව නොපැවති අතර එම පැමිණිලි පිළිබඳ වර්ගීකරණය පහත පරිදි වේ.

වගුව 03

| ඉල්ලීමේ ස්වභාවය | පැමිණිලි ගණන |
|---|---|
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 06 |
| සහය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 |
| වෙනත් ඉල්ලීම් | 01 |
| **එකතුව** | **08** |

ප්‍රස්ථාරය 03




මේ අනුව පැමිණිලි 57ක් 2017 වසර තුළ විමර්ශනයට භාජනය කරන ලද අතර ඉන් පැමිණිලි 36ක විමර්ශන කටයුතු මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත

- **2017 වසරේදී අවසන් වූ පැමිණිලි හා ප්‍රතිඵල**

වගුව 04

| ඉල්ලීමේ ස්වභාවය | අනුඅංකය[1] | ප්‍රතිඵලය |
|---|---|---|
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි | 37 | අදාළ වාර්තාව පොලිස් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති බව වින්දිතයා විසින් දැනුම් දීම ඇත. |
| | 40 | පැමිණිලිකරුගේ ඉල්ලීම ඉටුකර ඇත. |
| | 48 | සහකාර පොලිස් අධිකාරිගේ වාර්තාව අනුව සිද්ධියට වගකිවයුතු පොලිස් නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් පැමිණිලිකරුගේ අයිතීන් සුරැකී ඇත. |
| | 44 | අදාළ පොලිස් ස්ථානය විසින් විත්තිකරුට එරෙහිව නඩු පවරා ඇති බැවින් පැමිණිලිකරුගේ අයිතීන් සුරැකී ඇත. |
| 8,9 වගන්ති යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි | 15 | පැමිණිලිකාරිය අපරාධයක වින්දිතයකු ලෙස වර්ගකළ නොහැකි බැවින් කළමනාකරණ මණ්ඩල තීරණය අනුව ගොනුව වසා දමන ලදි. |
| | 11 | පොලිස් වාර්තාව අනුව ගොනුව වසන ලදී. |
| | 26 | පැමිණිලි විමර්ශනයෙන් පසුව තර්ජන නොමැති බව අනාවරණය වූ බැවින් ගොනුව වසන ලදී. |
| | 45 | පැමිණිලිකරුගේ ඉල්ලීම අධිකාරියේ විෂය පථයට අයත් නොවේ. |
| | 52 | පැමිණිලිකරුගේ ඉල්ලීම අධිකාරියේ විෂය පථයට අයත් නොවේ. |

[1] පැමිණිලිවල රහස්‍යභාවය උදෙසා පැමිණිලි අංකය සඳහන් කර නොමැත

| | | |
|---|---|---|
| ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 01 | පැමිණිලිකාරිය සම්බන්ධ කරගත නොහැකි වූ බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | 03 | පැමිණිලිකරුගේ ප්‍රකාශයට අනුව එම අවස්ථාවේ දී තර්ජනයක් නොමැති බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | 10 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව අදාළ වරද පනත පැනවීමට පෙර සිදු කරන ලද්දක් බැවින් ද වින්දිතයාට එම අවස්ථාවේ තර්ජතයක් නොමැති බැවින් ද ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | 14 | පොලිස් කොට්ඨාසයේ වාර්තාව අනුව පැමිණිලිකරුට තර්ජතයක් නොමැති බැවින්ද ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | 19 | ආරක්ෂාව සපයා දී පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදි. |
| | 29 | පැමිණිලිකරු විසින් විමර්ශන ක්‍රියාවලියට ප්‍රතිචාර නොදැක්වීම මත කටයුතු අවසන් කරන ලදි. |
| | 35 | පොලිස් විමර්ශන අනුව පැමිණිලිකරුට තර්ජනයක් හෝ බලපෑමක් නොමැති බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| | 47 | පැමිණිලිකාරිය අදාළ නඩුවේ චූදිතයකු වන බැවින් කළමනාකරණ මණ්ඩලය විසින් මෙම පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදි. |
| | 54 | පැමිණිලිකාරියගේ ඉල්ලීම මත පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදි. |
| සහාය අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 20 | විමර්ශන අවසන් කොට අවසන් තීරණය පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලේකම් දැනුවත් කර, ගොනුව වසන ලදී. |
| | 21 | පැමිණිල්ල අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 23 | අදාළ නඩුව දෙපාර්ශවය විසින් සමථයකට පත් කර ගෙන තිබූ බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි සහ 8,9 වගන්ති යටතේ වන වැරදි සම්බක්ධයෙන් වන වැරදි පැමිණිලි | 34 | පොලිස් කොට්ඨශයේ වාර්තාව අනුව 2015 අංක 4 දරන පනතේ 8,9 වගන්ති යටතේ වරදක් අනාවරණය නොවන බැවින් කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි ගොනුවේ කටයුතු අවසන් කරන ලදි. |
| 8,9 වගන්ති යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 60 | පැමිණිලිකරු අදාළ සිද්ධියේ සාක්ෂිකරුවකු නොවන බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 33 | පැමිණිලිකාරිය අපරාධයක වින්දිතයකු නොවන බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 38 | පනතේ 8,9 වගන්ති යටතේ වරදක් අනාවරණය නොවන බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි, 8,9 වගන්ති යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි සහ ආරක්ෂාව අපේක්ෂාවෙන් කරන ලද ඉල්ලීම් | 56 | පොලිස් වාර්තාව අනුව පැමිණිලිකරු අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් සමථයකට පත්ව ඇති බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |

| | | |
|---|---|---|
| වෙනත් ඉල්ලීම් | 12 | පැමිණිල්ල අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් අදාළ ආයතනයට වෙත යොමු කොට පැමිණිල්ලේ කටයුතු අවසන් කරන ලදී. |
| | 13 | ග්‍රාම නිලධාරී වාර්තාව අනුව පැමිණිලිකරුට තර්ජන නොමැති බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 18 | පැමිණිලිකාරිය විසින් අවශ්‍ය තොරතුරු ලබා නොදීම හේතුවෙන් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 27 | වංචා විමර්ශන කාර්යාංශය විසින් විත්තිකරුට විරුද්ධව නඩු පවරා ඇති බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 30 | මෙම ඉල්ලීම මඟින් නීති ප්‍රතිසංස්කරණ ඉල්ලා තිබූ බැවින් නීති කොමිසම වෙත ඉල්ලීම යොමු කර ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 32 | ඉල්ලීම අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන ලදී. |
| | 49 | පොලිස් වාර්තාව අනුව පැමිණිලිකරුගේ අයිතිවාසිකම් කඩවී නොමැති බැවින් ගොනුව වසා දමන ලදී. |
| | 53 | ඉල්ලීම අධිකාරියේ විෂය පථයට අයත් නොවේ. |
| | 55 | පැමිණිලිකරු විසින් අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සිවිල් නඩුවක් පවරා ගැනීමට එකඟ වී ඇති බැවින් තාක්ෂණික කමිටු තීරණය පරිදි ගොනුව වසා දමන ලදී. |
| | 59 | අදාළ සිද්ධිය ශ්‍රී ලංකාවේ දේශ සීමාවෙන් පිටත සිදුවීමක් බැවින් නීති ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවීම මත ගොනුව වසා දමන ලදී. |

- **2017 වසරේ දී අවසන් නොකරන ලද පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගෙන ඇති පියවර**

  අවසන් නොකරන ලද මුළු පැමිණිලි ගණන 21 කි. ඉන් පැමිණිලි 4ක් බහා තබා ඇති අතර පැමිණිලි 3ක් නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. ආරක්ෂාව සපයමින් පවතින පැමිණිලි ගණන 2ක් වන අතර නීතිඥ සහාය ලබා දීම සඳහා යොමු කරන ලද පැමිණිලි ගණන 03කි. එක් පැමිණිල්ලක් අවශ්‍ය කටයුතු සඳහා අදාළ ආයතනය වෙත යොමු කර ඇති අතර පැමිණිලි 2ක් සම්බන්ධයෙන් 2015 අංක 4 දරන පනතේ 16 වගන්තිය යටතේ වන විමර්ශන සඳහා යොමු කර ඇත.විමර්ශන මට්ටමේ පවතින පැමිණිලි ගණන 6 කි.

- වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) මිලියන 40 ක ප්‍රදානයක් රජයේ අනුමත ක්‍රියාපිළිවෙතට අනුව ලබා දුන්අතරඑම ගිවිසුම 2017.11.24 දින අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ සභාපති හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ විසින් අත්සන් කරන ලදී. එම ගිවිසුම ප්‍රකාරව අදාළ මුදල් අධිකාරියේ ඉදිරි වැඩසටහන් හා යටිතල පහසුකම් සංවර්ධනයට යොදා ගැනීම අධිකාරියේ කාර්යයක් වේ.

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කාර්යාලය විසින් 2017.11.22 දින සිට 2017.11.24 දින දක්වා මාලදිවයිනේ මාලේ නුවරදී පවත්වන ලද දූෂණයට එරෙහිව හඬ නගන්නන් (Whistle Blower) සහ සාක්ෂිකරුවන් (Witness) ආරක්ෂා කිරීම පිළිබඳ දකුණු ආසියානු වැඩමුළුව සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) සහ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා වැඩසටහන්) යන නිලධාරීන් සහභාගි වූ අතර එහිදී ශ්‍රී

ලංකාවට අදාළ නෛතික තත්වය හා ශ්‍රී ලාංකේය අත්දැකීම් අළලා ඔවුන් දෙදෙනා විසින් කෙටි දේශන පවත්වන ලදී.

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමේ වැඩසටහන් මාලාව යටතේ කොෆි ජාත්‍යන්තර ලන්ඩන් (Coffey International)ආයතනය විසින් සංවිධානය කරන ලද දූෂණයට එරෙහිව තොරතුරු සපයන්නන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේදී ඇති වන අභියෝග සම්බන්ධයෙන් වන පුහුණු වැඩමුළුවක් 2017 නොවැම්බර් මස 16 වන දින කොළඹ දී පවත්වන ලද අතර ඊට අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (නීති හා නීති බලාත්මක කිරීම) සහ කළමනාකරණ මණ්ඩල ලේකම් සහභාගී විය.

## ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ

- 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කරනු පිණිස ඉදිරිපත් කරන ලද 2017 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ සංශෝධන පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එය 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යන නමින් 2017 නොවැම්බර් මස 17 වන දින සම්මත කර ගන්නා ලදි. එම සංශෝධනයට අනුව මුල් පනතේ 31 වන වගන්තියේ (i) වන උපවගන්තිය සංශෝධනයට ලක් වූ අතර එතෙක් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට සාක්ෂි දෙන තැනැත්තකුට ශ්‍රී ලංකාව තුළ දූරස්ථ ස්ථානයක සිට සාක්ෂි ලබා දීමට ලබා දී තිබූ අවස්ථාව “ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත” දූරස්ථ ස්ථානයක සිට සාක්ෂි දිය හැකි වන පරිදි “ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත” යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරන ලදි.

## අධිකාරියේ කාර්යභාරය කරගෙන යාමේදී මුහුණ දුන් බාධක

- අවශ්‍ය ප්‍රමාණයට ගොඩනැගිලි පහසුකම් සහ කාර්යාල උපකරණ මෙන් ම සන්නිවේදන අවශ්‍යතා සහ ප්‍රවාහන පහසුකම් වැනි යටිතල පහසුකම් නොතිබීම
- සුදුසුකම් හා පළපුරුද්ද සහිත නිලධාරීන් පවත්නා වැටුප්තල මත සොයා ගැනීමට තිබූ අපහසුකම
- අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ක්‍රියාකාරකම් කිරීමට නොහැකි වීම

# අවසාන ගිණුම්

# 2017

## අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

අධිකරණ අමාත්‍යාංශය

පළමු මහළ, 428/11ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල

<u>2017.12.31න් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන්</u>

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. සංස්ථානික තොරතුරු

#### 1.1. ස්ථාපිත කිරීම හා නෛතික පසුබිම

2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය ස්ථාපිත කරන ලද අතර අධිකරණ අමාත්‍යංශය යටතේ එහි සේවා සැපයෙන ක්ෂේත්‍රය පුළුල් කෙරිණි. එහි ප්‍රධාන කාර්යාලය පළමු මහළ, 428/11ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

#### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

පනතෙහි අරමුණු ළඟා කර ගැනීමට අදාළව අධිකාරියේ රාජකාරි හා කාර්යයන් 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි 13 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.

#### 1.3 සේවකයන් සංඛ්‍යාව

2017 වසර අවසන් වන විට සේවකයන් සංඛ්‍යාව 26ක් විය.

### 2 සැකසීමේ පදනම

#### 2.1 අනුකූලතා ප්‍රකාශනය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සංචිත හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වෙනස්වීම ආදියෙන් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලැබේ.

#### 2.2. ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපුමක් නොකරන ලදී.

2.2 **කෘත්‍යාත්මක මුදල්**

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ කෘත්‍යාත්මක මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

3 **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත දක්වා ඇති මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියළු කාල සීමාවන් සඳහා නිත්‍ය වශයෙන් අදාළ කර ගන්නා ලදී.

**3.1. දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ අපේක්ෂිත භාවිතය සඳහා අදාළ වත්කම ක්‍රියාත්මක තත්වයට පත් කිරීමේ දී දැරීමට වන වියදම වේ. මූලිකව වත්කම පිරිවැයට හඳුනා ගැනීමෙන් පසුව ප්‍රත්‍යාගණනයට ලක් කළ වත්කම් ඉන් පසු ක්ෂය අඩු කිරීමෙන් අනතුරුව වන ප්‍රත්‍යාගණනය කරන ලද අගය මත පවත්වාගෙන යනු ලැබේ. අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවකාලයන් සහිත සංරචකවලින් යුක්ත වන විට ඒවා දේපළ, පිරියත හා උපකරණවල තනි අයිතම සඳහා අදාළ කර ගනු ලැබේ.

එක් එක් මුදල් වර්ෂය අවසානයේ වත්කමෙහි ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාල හා ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කර යෝග්‍ය නම් ගලපනු ලැබේ.

**ප්‍රදානයන් ලෙස ලද දේපළ, පිරියත හා උපකරණ**

ඕනෑම ප්‍රදානයක් යටතේ අත්පත් කර ගත් දේපළ, පිරියත හා උපකරණයක පිරිවැයට ප්‍රාග්ධනිත කෙරේ.

සින්නක්කර ඉඩම් හැර අනෙක් සියළු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසු පිරිවැයට පෙන්වනු ලැබේ. සින්නක්කර ඉඩම් පිරිවැයට පෙන්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර සියළු දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය ගණනය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පිරිවැය කපා හැරීම සඳහාය.

වසර සඳහා ක්ෂය වෙන් කරන ලද්දේ සමානුපාතික පදනම මතය.

පහත දක්වා ඇති පරිදි දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කරනු ලබන්නේ සරළ මාර්ග ක්‍රමය මතයි. තවද සියළු දේපළ, පිරියත හා උපකරණ **SLPSAS 7** - දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති පිරිවැය ක්‍රමය මත ගිණුම් තබන ලදී.

| | | |
|---|---|---|
| 1. | මෝටර් රථ | 20% |
| 2. | පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| 3. | පරිගණක හා උපාංග | 25% |
| 4. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| 5. | ගොඩනැගිලි | 4% |
| 6. | මෘදුකාංග | 25% |
| 7. | වෙනත් | 10% |

දේපළ, පිරියත හා උපකරණවලට අයත් අයිතමයක් ඉවත් කරනු ලබන්නේ බැහැර කිරීමේ දී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීම තුළින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවකදීය. වත්කමක් ඉවත් කිරීමේදී සිදු වන ලාභයක් හෝ පාඩුවක් (ඉවත් කිරීම්වලින් ශුද්ධ ලැබෙන මුදල හා වත්කම දරණ ලද අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම ඉවත් කරන වසරෙහි ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිති මගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙන යාමේ අරමුණින් දේපළ, පිරියත හා උපකරණව අළුත්වැඩියා කිරීම හෝ නඩත්තුව සඳහා වන වියදම එය ඇති වූ අවස්ථාවේ දී වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.2 භාණ්ඩ තොගය

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරනු ලබන භාණ්ඩ තොගය අදායම් හා වියදම් ප්‍රකාශනයේ පිරිවැයට අගය කර ඇත.

පිරිවැය, විකුණුම් මිළ හෝ ශුද්ධ උපලබ්ධි අගය යන තුනෙන් වඩා අඩු අගය මත ඉතිරි භාණ්ඩ තොගය අගය කරනු ලැබේ.

### 3.3. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල්වලින් සමන්විත වේ.

### 3.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන ලදී.

### 3.5. වගකීම් හා වෙන් කිරීම්

පසුගිය සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති විට ශේෂ පත්‍රයෙහි වගකීම් හඳුනා ගනු ලබන අතර එය නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ගලා යාමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසකර කාලයක් තුළ පියවිය හැකි බැඳීම් ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි වර්තමාන නෛතික හෝ වැඩදායී බැඳීමක් වේ නම් හා අදාළ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාමක් අවශ්‍ය වේ නම් වෙන්කිරීම් හඳුනා ගත හැකිය.

### 3.6. බදුකරණය

බදු වියදම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුව ගණනය කර ඇත.

### 3.7. සේවක ප්‍රතිලාභ

### I. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිර්වාචිත දායකත්ව සැලැස්ම පිළිබඳ බැඳීම සිදු කළ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල වෙත සේවකයන්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% දායකත්වයක් දරණු ලැබේ.

### II. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

පාරිතෝෂිකය යනු නිර්වාචික ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතිය අනුව පාරිතෝෂිකය ගෙවීමට අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම සඳහා සේවය කළ පළමු වසරින් ආරම්භ කර සේවා කාලයෙහි සම්පූර්ණ කරන එක් එක් වසර සඳහා සියළු ම සේවකයන්ගේ පසුගිය මුදල් වර්ෂයෙහි අවසන් වරට ලබා ගත් අඩ මසක වැටුප මත පදනම්ව ගණනය කරන මුදලට සමාන ප්‍රතිපාතදනයක් ශේෂ පත්‍රයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1993 අංක 12 දරණ පාරිතෝෂිකය ගෙවීමේ පනත යටතේ ගෙවිය හැකි පාරිතෝෂිකයට අදාළව සියළු සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙම අයිතමය ශේෂ පත්‍රෙයහි ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩගත කෙරේ.

මහා භාණ්ඩාගාරයට අනුව ඔවුන් අවශ්‍ය වූ විට අරමුදල් පිරිණමන බැවින් මේ සඳහා අරමුදලක් අවශ්‍ය නොවේ.

### 3.8. අධිකාරියේ අරමුදල්

පනතෙහි 18 හා 29 වන වගන්තීන් ප්‍රකාරව අරමුදල් දෙකක් (2) අධිකාරිය සතුවේ.

1. අධිකාරියේ අරමුදල

   මෙම අරමුදල සඳහා පහත අයුරින් මුදල් බැර කළ යුතුය.
   - අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කෙරෙන සියළු ම මුදල්
   හා
   -පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අධිකාරිය වෙත ලැබෙන සියළු මුදල්.

   පනත යටතේ අධිකාරියේ රාජකාරි හා කාර්යයන් ඉටු කිරීමේ දී සිදු වන වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුත්තේය.

2. ආරක්ෂක අරමුදල

   ආරක්ෂ අරමුදල සඳහා මුදල් බැර කිරීම පහත පරිදි සිදු කළ යුත්තේය.

   -අරමුදල සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරෙන සියළු මුදල්;

- පරිත්‍යාගයන්, ත්‍යාග, පැවරීම් හා ප්‍රදානයන් ලෙස දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අධිකාරිය වෙත ලැබෙන ආර්කෂක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට නියමිත සියළු මුදල්.
-28 වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියළු මුදල්.

29 වන වගන්තියෙහි (4) (අ) හා (ආ) උප වගන්ති යටතේ වන ගෙවීම් සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආරක්ෂක අරමුදලින් ගෙවීම් සිදු කෙරේ.

## 3.9. ආදායම හඳුනාගැනීම

### 3.9.1 ආදායම හඳුනාගැනීම

වන වගන්තියෙහි (1) (අ) (ii) උප වගන්ති යටතේ අධිකරණය විසින් ප්‍රේෂණය කෙරෙන සියළු මුදල් ලැබීමේ පදනම මත ගණනය කරනු ලබන අතර පොළිය හා වෙනත් සියළු ආදායම් උපචිත පදනම මත ගණනය කෙරේ.

### 3.9.2 වියදම

මණ්ඩලය පවත්වාගෙන යාමේ දී දරන ලද සියළු වියදම් උපචිත පදනම මත ගණනය කරන ලද අතර මණ්ඩලයේ ඉපයීමේ ධාරිතාව පවත්වාගෙන යාම හෝ ඉහළ නැංවීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීමට අදාළව දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබීය.

## 3.10. සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය වූ විට වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් යළි සකස් කරන ලදී.

## 3.11. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයට පෙර සියළු සිදුවීම් සලකා බලන ලද අතර යෝග්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනයට අදාළව ගැලපීම් හෝ අනාවරණයන් සිදු කරන ලදී.

## 3.12. වගකීම් හා අවිනිශ්චිතතාවන්

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීම්වලට අදාළ වත්කම් හෝ බැඳීම් වන අතර මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට වන අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත තවවුරු කරනු ලැබේ.

**3.13.** ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

**i.** රාජ්‍ය ප්‍රදානයන්

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළු රාජ්‍ය ප්‍රදානයන් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත පරිදි වේ.

අ. වත්කම් මිළ දී ගැනීම සඳහා වන රාජ්‍ය ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

ආ. ලැබෙන වෙනත් ප්‍රදානයන් මෙන් ම ඉන් පසු සිදු ඇති වන වියදම් ලාභ හා පාඩුවල ඇතුළත් කරන ලදී.

## 3.14. ආයෝජනය

යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට එහි අරමුදල වෙත බැර කර ඇති මුදල් ආයෝජනය කිරීම, බැංකුවෙහි ජංගම, ඉතුරුම් හො තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ 14 වන වගන්තියෙහි (ආ) උප වගන්තිය යටතේ විස්තර කෙරේ.

පනතට අනුකූල වන පරිදි එහි අරමුදලට බැර කරන ලද මුදල් යෝග්‍ය හා ආරක්ෂිත ආකාරයට මූල්‍ය උපකරණවල ආයෝජනය කරනු ලැබේ. එම ආයෝජන පිරිවැය පදනම මත ගිණුම්ගත කරනු ලබන අතර එවැනි ආයෝජන මගින් උපයන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| | NOTE | 2017<br>Rs |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් | **08** | - |
| **මුළු ජංගම වත්කම්** | | **-** |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ | **09** | 2,661,293 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,661,293** |
| **මුළු වත්කම්** | | **2,661,293** |
| අඩු කළා: | | |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | **-** | - |
| **මුළු ජංගම වගකීම්** | | **-** |
| **ශුද්ධ ජංගම වත්කම්** | | **-** |
| **ජංගම නොවන වගකීම්** | **-** | **-** |
| **මුළු වගකීම්** | | **-** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **2,661,293** |
| **මූල්‍යානය සිදු කළේ පහත ආකාරයටයි** | | |
| සමුච්චිත අරමුදල | **10** | - |
| රාජ්‍ය හා අරමුදල් ප්‍රදානයන් | **11** | 2,661,293 |
| | | **2,661,293** |

අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවට අත්සන් කර ඇත."

| | | |
|---|---|---|
| ............................................. | ............................................. | ............................................. |
| ජී.ඩී.ආර්. පෙරේරා | උදයකුමාර අමරසිංහ | සුහද ගම්ලත් |
| අධ්‍යක්ෂ (මුදල්) | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) | සභාපති |

**2017 දෙසැම්බර් 31න් අවසන් වන වසරෙහි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**
**YEAR ENDED 31ST DECEMBER 2017**

| | සටහන | 2017<br>රු. | |
|---|---|---|---|
| **ආදායම** | **1** | | |
| ප්‍රදානයන් | **1.1** | 5,123,226 | |
| වෙනත් ආදායම් | **1.2** | 68,238 | |
| **මුළු ආදායම** | | **5,191,464** | |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගලික වේතන | **2** | 4,185,310 | |
| ගමන් වියදම් | **3** | 42,168 | |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | **4** | 158,427 | |
| නඩත්තුව | **5** | 5,590 | |
| ගිවිසුම්ගත සේවාවන් | **6** | 731,731 | |
| ක්ෂය වීම | **7** | 68,238 | |
| **මුළු වියදම්** | | **5,191,464** | |
| **අදාළ කාල සීමාව අතිරික්තය/ (හිඟය)** | | - | |

** 2017.09.29 දින අධිකාරිය විසින් ලංකා බැංකුවෙහි ජංගම ගිණුම් විවෘත කරන ලදී.
ඊට පෙර අධිකරණ අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙනුවෙන් 2017.09.29 දක්වා තම විසර්ජන ගිණුම හරහා සියළු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දරණ ලදී.
එබැවින් අවසන් ගිණුම් ප්‍රකාශනය - 2017 2017.10.01 - 2017.12.31 දක්වා වූ කාල සීමාව සඳහා සකස් කරන ලදී.

අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

**2017.12.31න් අවසන් වූ වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2017<br>Rs |
|---|---|
| **මෙහෙයුම් කටයුතු මගින් සිදු වන මුදල් ප්‍රවාහය** | |
| වසර සඳහා වන අතිරික්තය/ (හිඟය) | - |
| අඩු කළා: | |
| ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම | (68,238) |
| එකතු කළා: වසර සඳහා ක්ෂය වීම | 68,238 |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් වෙනස** | - |
| භාණ්ඩ තොග වැඩි වීම | - |
| වෙළඳ හා වෙනත් ලැබීම් අඩු වීම | - |
| පෙර ගෙවීම් ඉහළ යාම | - |
| උපචිත වියදම් හා ගෙවිය හැකි දේ අඩු වීම | - |
| වසර තුළ ගෙවන ලද පාරිතොෂික | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | - |
| **ආයෝජන කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | |
| ස්ථාවර වත්කම් මිළ දී ගැනීම | - |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලබන මුදල් | - |
| ආයෝජනය | - |
| **ආයෝජන කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | - |
| **මූල්‍ය කටයුතු මගින් වන මුදල් ප්‍රවාහය** | |
| ප්‍රාග්ධන ප්‍රදාන | - |
| **මූල්‍ය කටයුතු මගින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | - |
| **භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | - |
| 2017.01.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ | - |
| 2017.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ 31/12/2017 | - |

අධිකරණ අමාත්‍යාංශය වෙතින් ලද ප්‍රාග්ධන ප්‍රදානය මුදල් ලෙස නොව ස්ථාවර වත්කම් (ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ)
ලෙස ලැබුණු බැවින් ප්‍රාග්ධන ප්‍රදානය මූල්‍ය කටයුතු මගින් වන මුදල් ප්‍රවාහයක් ලෙස නොගැනේ.

**

**අපරාධයක වින්දිතයන්හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය**

**2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සංචිතයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

| | අරමුදල් (රු) | ප්‍රදානයන් (රු) | සමුච්චිත අරමුදල හා සංචිත (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 2016 ජනවාරි 1 දිනට ශේෂය | - | - | - | - |
| වසර තුළ මාරු කිරීම් | - | - | - | - |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | - | - | - | - |
| 2017 ඔක්තෝම්බර් 1 දිනට අගය | - | 2,729,531 | - | 2,729,531 |
| වසර තුළ මාරු කිරීම් | - | 68,238 | - | 68,238 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **-** | **2,797,769** | **-** | **2,797,769** |

## සටහන්

| **01 සටහන**<br>**ආදායම** | **2017**<br>**රු** |
|---|---|
| **1.1 - ප්‍රදානයන්** | |
| රාජ්‍ය ප්‍රදානයන්- පුනාරාවර්තන | 5,123,226 |
| **1.2 - වෙනත් ආදායම්** | |
| විලම්භිත ආදායම | 68,238 |
| **මුළු ආදායම** | **5,191,464** |

| **02 සටහන**<br>**වියදම්** | **2017**<br>**රු** |
|---|---|
| **පුද්ගලික වේතන** | |
| වැටුප් හා වේතන | 1,662,570 |
| සේවක අර්ථසාධක අරමුදල | 302,457 |
| සේවක භාර අරමුදල | 75,614 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 12,886 |
| වෙනත් දීමනා | 2,131,784 |
| **එකතුව** | **4,185,310** |

| **03 සටහන**<br>**ගමන් වියදම්** | **2017**<br>**රු** |
|---|---|
| ගමන් - දේශීය | 4,100 |
| ගමන් - විදේශීය | 38,068 |
| **එකතුව** | **42,168** |

| **04 සටහන**<br>**සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ** | **2017**<br>**රු** |
|---|---|
| මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය | 67,962 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 36,834 |
| විනෝද කටයුතු | 30,771 |
| වෙනත් සැපයුම් | 22,860 |
| **එකතුව** | **158,427** |

| **05 සටහන**<br>**නඩත්තුව** | **2017**<br>රු |
|---|---|
| නඩත්තු වියදම් - ගොඩනැගිල්ල හා ව්‍යුහය | 1,000 |
| නඩත්තු වියදම් - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 4,590 |
| **එකතුව** | **5,590** |

| **06 සටහන**<br>**ගිවිසුම්ගත සේවාවන්** | **2017**<br>රු |
|---|---|
| ප්‍රවාහනය | 3,636 |
| තැපැල් හා විදුලි සංදේශ ගාස්තු | 63,331 |
| විදුලිය හා ජලය | 4,927 |
| පවිත්‍රතා ගාස්තු | 406,105 |
| වෙළඳ ප්‍රචාරණය | 251,333 |
| වෙනත් සේවාවන් | 2,400 |
| **එකතුව** | **731,731** |

| **07 සටහන**<br>**ක්ෂය වීම** | **2017**<br>රු |
|---|---|
| ගොඩනැගිල්ල | - |
| මෝටර් රථ | - |
| පරිගණක | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 68,238 |
| මෘදුකාංග සංවර්ධනය | - |
| සන්නිවේදනයන් | - |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | - |
| වෙනත් | - |
| | - |
| **එකතුව** | **68,238** |

| **08 සටහන**<br>**අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්** | **2017**<br>රු |
|---|---|
| ලංකා බැංකුව - C/A - 81479591 | - |
| ලංකා බැංකුව - C/A - 81624249 | - |
| **එකතුව** | **-** |

| **10 සටහන**<br>**සමුච්චිත අරමුදල** | **2017**<br>රු |
|---|---|
| ආරම්භක ශේෂය | - |
| වසර සඳහා වන අතිරික්තය/ (හිඟය) | - |
| **එකතුව** | **-** |

| **11 සටහන**<br>**රාජ්‍ය ප්‍රදානයන්** | **2017**<br>රු |
|---|---|
| ආරම්භක ශේෂය | 2,729,531 |
| වසර තුළ වන මාරු කිරීම | (68,238) |
| **එකතුව** | **2,661,293** |

**9 සටහන**

## අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

### 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්

| තොරතුරු | ගොඩනැගිලි | මෝටර් රථ | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | පරිගණක | පිරියත හා යන්ත්‍රෝපකරණ | මෘදුකාංග | වෙනත් | ඉඩම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| **2017 ඔක්තෝම්බර් 01 දිනට පිරිවැය** | **-** | **-** | **2,729,531** | **-** | **-** | **-** | **-** | **-** | **2,729,531** |
| එකතු කිරීම් | - | - | - | - | - | - | - | - | - |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | **-** | **-** | **2,729,531** | **-** | **-** | **-** | **-** | **-** | **2,729,531** |
| **2017 ඔක්තෝම්බර් 01 දිනට සමුච්චිත ක්ෂය** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක්ෂය වීම | - | - | 68,238 | - | - | - | - | - | **68,238** |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - | - | **-** |
| **2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** | **-** | **-** | **68,238** | **-** | **-** | **-** | **-** | **-** | **68,238** |
| **2017 ඔක්තෝම්බර් 01 දිනට ලියා හළ අගය** | **-** | **-** | **2,729,531** | **-** | **-** | **-** | **-** | **-** | **2,729,531** |
| **2017 දෙසැම්බර් 31 දිනට ලියා හළ අගය** | **-** | **-** | **2,661,292** | **-** | **-** | **-** | **-** | **-** | **2,661,292** |

** 2017.10.29 දින ලංකා බැංකුවෙහි ජංගම ගිණුමක් විවෘත කිරීමට පෙර අධිකරණ අමාත්‍යාංශය විසින් විසර්ජන ගිණුම හරහා අධිකාරිය වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් දරණ ලදී.

එබැවින් 2017.10.01 දිනට ස්ථාවර වත්කම් අගය ගණනය කරනු ලබන්නේ අධිකාරිය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් මිළ දී ගන්නා ස්ථාවර වත්කම්වල ගැණුම් අගය මත පදනම්වය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: ජේපීඑ/බී/එන්ඒපීවීසිඩබ/01/17/66
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018 දෙසැම්බර් 06 දින

අධ්‍යක්ෂ ජනරාල්

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහයදීමේ සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ත්‍රෛමාසය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහයදීමේ සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් ත්‍රෛමාසය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහයදීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 39 (1) වගන්තිය සමහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමහ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මං අදහස් කරන, මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2018 නොවැම්බර් 12 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සංස්ථාපනය කිරීම

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ IV වන කොටසේ 11 (1) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 මැයි 16 දිනැති අංක 1967/8 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහයදීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ I, II, III, IV, V, VI, VII, VIII සහ IX වන කොටස් වල ක්‍රියාත්මක විය යුතු දිනය ලෙස 2016 මැයි 18 වෙනි දිනය නියම කර ඇත.

## 1.5 පාලක මණ්ඩලය

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහයදීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ IV වන කොටසේ 12 වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයකට පැවරිය යුතුය.

(අ) පහත දැක්වෙන නිළ බලයෙන් පත් වූ සාමාජිකයන්-

i. අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයා විසින් නම් කළ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
ii. පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
iii. කාන්තා කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
iv. ළමයින් පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
v. 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නම් කළ එකී සභාවේ සාමාජිකයෙකු
vi. නීතිපතිවරයාගේ නාමිකයෙකු
vii. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ධුරය දරන පොලිස්පතිවරයාගේ නාමිකයෙකු

එසේ වුව ද, මෙම ඡේදයේ (iii) වන සහ (iv) වන අනුඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති විෂයයන් එක් අමාත්‍යවරයෙකුට පවරා ඇති විටෙක හෝ භාරයේ පවතින අවස්ථාවක දී, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට පමණක්, මෙම ඡේදය යටතේ මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්වීමට හිමිකම ඇත්තේය.

(ආ) ජනාධිපතිවරයා විසින් අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත වෘත්තීන්වල හෝ වෘත්තීමය ක්ෂේත්‍රවල අධ්‍යානිතික හෝ වෘත්තීමය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කර ගත් සාමාජිකයන් පස්දෙනෙකු.

(2) ජනාධිපතිවරයා විසින්, මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත්කළ යුතු අතර, ඔහු අධිකාරියේ සභාපතිවරයා ද විය යුතුය.

පනතේ උක්ත වගන්ති ප්‍රකාරව අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් 11 දෙනෙකු පත්කර තිබුණි.

## 1.6 පරමාර්ථ / ඉලක්ක

---

පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව පනතේ අරමුණ වන්නේ

(අ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම, ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම;

(ආ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබාදීම.

(ඇ) අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම.

(ඇ) ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව, අපරාධයක වින්දිතයන්ට සහන ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඉ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ, රජයේ, අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්ය සහ වගකීම් දැක්වීම;

(ඊ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදුකරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම සහ;

(උ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

පනතේ IV වන කොටසේ 13(1) වගන්තිය අනුව අධිකාරියේ කාර්ය සහ කර්තව්‍යයන් විය යුත්තේ :-

(අ) අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනාගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනාගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඇ) අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම;

(ඇ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩකරන ලදැයි යන්න පිළිඳව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩකිරීම පිළිබඳව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම;

(ඉ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළුව අවශ්‍ය සහාය සැපයීම;

(ඊ) අපරාධයක වින්දිතයන් හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) මේ පනත මගින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම;

(ඌ) විශේෂයෙන්ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට -

i. ඵලදායී ආරක්ෂාව;
ii. අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ උපදේශනය; සහ
iii. වෙනත් සුදුසු සහායන්,

සැපයීම ඇතුළුව, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයෙන් ලබාදීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන්ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම;

(එ) විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා ඒවා සමාලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින්, සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදාගැනීම පිළිබඳව නිර්දේශ කිරීම;

(ඒ) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳව තොරතුරු ලබා දීමට සැලැස්වීම;

(ඔ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතුන් නිසා සිදුවන හානි හෝ සිදුවිය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස සහ සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම;

(ඕ) ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තයන් විසින්, අපරාධයක වින්දියතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලන සංග්‍රහයේ සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම;

(ක) (i) අපරාධ සිදුවීම අඩුකළ හැකි;

(ii) නිශ්චිත අපරාධවලින් වින්දිතයන් හට සිදුවන බලපෑම අවම කළ හැකි හෝ වැළැක්විය හැකි;

(iii) වින්දිතයන්ට ඵලදායී ලෙස ප්‍රතිකාර කළ හැකි, පුනරුත්ථාපනය කළ හැකි, උපදේශනය කළ හැකි, සහාය දිය හැකි, වන්දි ගෙවිය හැකි සහ ආරක්ෂා කළ හැකි;

(iv) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට හෝ අධිකරණයක් ඉදිරිපිට සහ වෙනත් කොමිෂන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් විනිශ්චය සභාවක් ඉදිරිපිට වූ නඩු කටයුත්තක දී, බියෙන් තොරව සාක්ෂිකරුවන් හට ප්‍රකාශයන් කිරීමට හෝ සාක්ෂි දීමට උපකාරී වන පරිසරයක් නිර්මාණය කළ හැකි,

(v) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැලසිය හැකි,

ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හෝ එසේ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම;

(ග) අපරාධ සිදුවීම් අඩුකිරීම සඳහා සහ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ අරක්ෂාව පිළිබඳව පහසුකම් සැලැස්වීම සඳහා අදාළ රජයේ ආයතනවලට ඒ ආයතන මඟින් තෝරාගනු ලැබිය හැකි සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික, ආර්ථික සහ අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීම;

(ච) අපරාධ යුක්ති පද්ධතිය තුළ දඩුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධයක වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;

(ජ) අපරාධ යුක්ති පරිපාලනය කිරීමේ ක්‍රමයක් ලෙස සහ අපරාධ යුක්ති පද්ධතිය තුළ දඩුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන්, පෙර තිබූ තත්ත්වයකට පැමිණවීම සඳහා යුක්ති සහගත පියවර ගැනීම වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;

(ට) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම, යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඩ) අපරාධයක වින්දියතන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නියමු උපදේශන නිකුත් කිරීම;

(ණ) (i) අධිකාරිය විසින් මේ පනතේ අරමුණුවලට බලාත්මක භාවයක් දී ඇති ආකාරය;

(ii) අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම; සහ

(iii) අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ,

පිළිබඳ වර්තාවක් වාර්ෂික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ත) මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ යම් කර්තව්‍ය හා කාර්යයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.

## 1.7 ක්‍රියාත්මක වීම

2016.01.08 දින සිට අධිකාරියේ ක්‍රියාකාරිත්වය ආරම්භ කර ඇති අතර ගණුදෙනු සඳහා 2017.09.20 දින හා 2017.10.10 දින රාජ්‍ය බැංකුවක බැංකු ගිණුම් ආරම්භ කර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 3 ක කාලපරිච්ඡේදයට අදාළ වූ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීම සහ ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් මාසයට අදාල රු.24,078 ක දුරකථන වියදම උපචිත පදනම මත ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ආයතනයේ ගිණුම් කාලපිච්ඡේදය 2017 ඔක්තෝබර් 01 දින සිට වන නමුත් ගිණුම් කාල පරිච්ඡේදයට අදාල නොවූ 2017 සැප්තැම්බර් මාසයේ දරන ලද රු.11,859 ක් වූ දුරකතන බිල්පත් වියදම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.21,660,500 ක් මුදල් පොතේ හා අදාල ආදායම් ගිණුමට සටහන් කිරීමෙන් තොරව සෘජුව බැංකුවේ තැන්පත් කර තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

2017 වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන ප්‍රදාන ලෙස රු.5,462,000 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණද එය මූල්‍ය ප්‍රකාශන අනුව රු.5,123,226 ක් ලෙස සටහන් කර තිබීම නිසා රු.338,773 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 625 හා 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 හි 5 ඡේදය | යූඑන්ඩීපී ව්‍යාපෘතිය මඟින් අධිකාරියේ බැංකු ජංගම ගිණුමට සෘජුවම බැර කර තිබූ රු.21,660,500 ක මුදල චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් තැබීම සිදු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 753 (2) | ආයතනය වෙත අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදී ඇති රු.2,729,531 ක් වටිනා ස්ථාවර වත්කම් ලැබීම් සඳහා ආයතනය විසින් ලැබීම් ඇනවුම් නිකුත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මුළු ආදායම රු.5,191,464 ක් වූ අතර මුළු වියදමද රු.5,191,464 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය ශුන්‍ය අගයක් ගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 54ක් වූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ පැවති තනතුරු සංඛ්‍යාව 27ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 20ක් (උදා : නීති නිලධාරි - 02, විමර්ශන නිලධාරි - 06, පරිවර්තක - 01, තොරතුරු නිලධාරි - 01, ආරක්ෂක නිලධාරි - 10) 2017 දෙසැම්බර් 31 දින වන විටත් තවදුරටත් පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පී/ඊ/ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 11 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

අධිකාරිය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින්ද සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලනයන් | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ආයතනය ලෙජර ගිණුම් තැබීමේදී සම්මත ගිණුම්කරණ ආකෘතිය (හර බැර වශයෙන්) භාවිතා කර නොතිබීම. |
| (ආ) අත්තිකාරම් ගෙවීම් | නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේදී හා පියවීමේදී වෙනම අත්තිකාරම් ගිණුමක් භාවිතා කර නොතිබීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති